පොදු චක්‍රලේඛ 03/2026

මගේ අංකය - DCDSP/02/12/iv
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 147/3,
පෙට්ටිගලවත්ත,
ගාල්ල.
2026.03.16

දකුණු පළාතේ සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපති වරු වෙත,

<u>දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තිය අනුව සමුපකාර සමිතියක ගිණුම් පවත්වාගෙන යෑම හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා විගණනය සඳහා පහසුකම් සැපයීම.</u>

දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තිය ඇතුළු නෛතික ප්‍රතිපාදනයන්ට අනුව දකුණු පළාතේ ලියාපදිංචි සමුපකාර සමිතියක් විසින්ම සමිතියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියළු ගනුදෙනු පිළිබඳව නිසිපරිදි ගිණුම් පවත්වාගෙන යාම සඳහා වන ප්‍රමිතීන් මවිසින් නියම කරනු ලැබිය යුතුය. ඒ අනුව මෙම චක්‍රලේඛය 2019.04.09 වන දින අංක 2118/40 දරණ ශ්‍රී ලංකා ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 38 වන වගන්තිය හා 2019.05.13 වන දින අංක 2123/6 දරණ ශ්‍රී ලංකා ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 2019 දකුණු පළාත් සමුපකාර සමිති රීතින්හි 36 හා 38 වැනි රීතීන් අනුව නිකුත් කරනු ලැබේ.

2. <u>සමුපකාර සමිතියක ගිණුම් පවත්වාගෙන යෑම.</u>

සෑම ලියාපදිංචි සමුපකාර සමිතියක්ම සමිතියේ ආදායම් හා වියදම්, වත්කම් හා වගකීම් යටතට ගැනෙන සියලුම ගණුදෙනු හා සිද්ධීන් නියමිත පරිදි පොත්පත්වල වාර්තාගත කළ යුතුය. එසේ වාර්තාගත කිරීමේදී,

2.1. සමිතියේ සියළුම ගනුදෙණු හා සිද්ධීන් වලට අදාලව මූලාශ්‍ර ලේඛණ හා උපයෝගී පොත් පවත්වාගෙන යා යුතුය.

2.2. එම ගණුදෙනු හා සිද්ධීන්ට අදාල මූලාශ්‍ර ලේඛණ හා උපයෝගී පොත් ආශ්‍රයෙන් පොදු ලෙජරයක් පවත්වාගෙන යා යුතුය.

2.3. අවම වශයෙන් මාසිකව පොදු ලෙජරය තුලනය කළ යුතු අතර, එදිනට ඒ ඇසුරින් ශේෂ පිරික්සුමක් පිළියෙල කල යුතුය.

2.4. සමිතියේ මුදල් වර්ෂය අවසානයේදී පහත සඳහන් ගිණුම් හා සංඛ්‍යාන පිලිබඳ තොරතුරු ඇතුලත් වාර්ෂික අවසාන ගිණුම් හා ප්‍රකාශනයන් පිළියෙල කල යුතු බැවින් හා මුදල් වර්ෂය අවසන්වී මාස 03 ක් ඇතුලත රෙජිස්ට්‍රාර්වරයාට / සහකාර කොමසාරිස්වරයාට ඉදිරිපත් කළ යුතු බැවින් ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කල යුතු ය.

i. විස්තීරණ ආදායම් ප්‍රකාශනය
ii. ආංශික විස්තීරණ ආදායම් ප්‍රකාශනයන්
iii. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
iv. ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය
v. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
vi. මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම් සටහන්
vii. වත්කම් , වගකීම්, ස්කන්ධය සනාථ කිරීම සඳහා ලේඛණයන්
viii. ශේෂ පිරික්සුම

3. සමුපකාර සමිතියක ගිණුම් පොත්පත් පවත්වාගෙන යාමේදී අනුගමනය කලයුතු ප්‍රමිතීන් හා නියමයන්

3.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව ඒ ඒ සමිතියට අදාලව ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ස්ථාපිත කළ යුතු අතර එම ප්‍රතිපත්තීන් මහා සභා අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව සහකාර කොමසාරිස්වරයා මගින් මා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

එම ගිණුම්කරණ ප්‍රමිත ස්ථාපිත කිරීමේදී පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනිවාර්යෙන් ඇතුලත් කර ගත යුතුය.

3.1.1 දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීමේදී පහත සඳහන් ප්‍රතිශතයන් භාවිතා කල යුතුය.

- ඉඩම් ක්ෂය කරනු නොලැබේ
- ගොඩනැගිලි 5%
- කාර්යාල උපකරණ හා සවිකිරීම් 20%
- රථ වාහන 25%
- යන්ත්‍ර සූත්‍ර 25%
- පරිගණක මෘදුකාංග හා දෘඩාංග 50%
- CCTV කැමරා පද්ධති 50%
- සූර්ය පැනල පද්ධති 5%
- සූර්ය පැනල පද්ධතියට අදාල විදුලි උපකරණ 25%

3.1.2. ඉහත අනුපාතයන් කෙසේ වුවත් විශේෂ ව්‍යාපෘති හා සේවාවන් සිදුකරන සමිති සඳහා අවශ්‍ය ක්ෂය අනුපාතයන් සකසා ගැනීමට සමිතියේ කාරක සභාවට/ අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ඇති අතර, එසේ සකස්කර ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්තීන් අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

(ඉහත කී පරිදි ක්ෂය අනුපාතයන් තීරණය කිරීම සඳහා භාණ්ඩය සපයන ආයතනය ලබාදෙන වගකීම් කාලය සහ සේවා කොන්දේසි මත ඵලදායී ජීවකාලය තීරණය කරගැනීම යෝග්‍යය බවට උපදෙස් දෙමි.)

I. වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම

සියලුම සමුපකාර සමිතිවල ඒකීය ක්‍රමයක් ක්‍රියාත්මක විය යුතු වීම හේතුවෙන් හා වෙනත් තීරණයන් ගැනීමේදී ඇතිවිය හැකි අපහසුතාවයන් හා යථාතත්ත්වය විකෘති වීම් වලක්වා ගැනීමේ අරමුණින්, සමුපකාර සමිතියක දේපල ප්‍රත්‍යාගණනය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව හඳුන්වා දී ඇති ප්‍රමිතයේ අවශ්‍යතාවයන් ඒ ආකාරයෙන්ම ඉටුකල යුතු බවත්, ඊට අමතරව එකී තොරතුරු ගිණුම් වලට ඇතුලත් කිරීමට පෙර මාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

II. මූල්‍ය සේවා අංශ සඳහා ණය හානි සඳහා වෙන්කිරීම

ලබා ගෙන ඇති ණය මුදලේ මුල් මුදල සහ පොළිය යන දෙකම හෝ ඉන් එකක් ගෙවිය යුතු දින සිට නොගෙවා පැහැර හැර ඇති දින ගණන අනුව නොපියවා තිබෙන මුළු මුදල පදනම්ව පහත පරිදි සිදු කල යුතුය.

- දින 90 සිට දින 180 දක්වා කල් ඉකුත් වූ අක්‍රිය ණය සඳහා 0% ක්,
- දින 180 සිට 360 දක්වා අව ප්‍රමාණ අක්‍රිය ණය සඳහා 20% ක්,
- දින 360 සිට 540 දක්වා අඩමාන අක්‍රිය ණය සඳහා 50% ක්,
- දින 540 ට වැඩි බොල් අක්‍රිය ණය සඳහා 100%
  (මේ යටතට උසාවිගත කල ණය , තීරක ප්‍රදානලත් ණය වටිනාකමද ඇතුලත්විය යුතුය)

III. දේපල ඇප මත ණය සඳහා වෙන්කල ණය හානි වෙන්කිරීම් අඩුකිරීම

දේපළ ඇපමත ණය වලදී ඉහත ඡේදය අනුව වෙන්කල බොල් ණය ප්‍රතිපාදනයෙන් පහත ප්‍රමාණයන් තක්සේරු කළ දේපළ වටිනාකම අනුව ණය නොගෙවා පැහැර ඇති කාල සීමාව

- දින 180 සිට දින 1080 දක්වා වන විට 100% ක් අඩුකල හැකිය
- දින 1080 සිට දින 1800 දක්වා වන විට 75% ක් අඩුකල හැකිය
- දින 1800 සිට දින 3600 දක්වා වන විට 50% ක් අඩුකල හැකිය
- දින 3600 ට වැඩි වන විට 10% ක් අඩුකල හැකිය

IV. මූල්‍ය හැර අනෙකුත් අංශ සඳහා ණය හානි වෙන්කිරීම්

මුදල් වර්ෂය අවසන් දිනට පවතින ණය ගැති ශේෂයෙන් 10% ක් ණය හානි සඳහා වෙන් කිරීම සිදුකල යුතුය.

V. ආධාර, පරිත්‍යාග හා රාජ්‍ය ප්‍රදාන

සමුපකාර සමිතියකට ලැබෙන ආධාර, පරිත්‍යාග, රාජ්‍ය ප්‍රදාන, මුදල් වශයෙන් හෝ භාණ්ඩ වශයෙන් මෙන්ම වගකීම් අත්හැරීම් තුලින් ද සමිතිවලට ලැබෙනු ඇත. මේවා ගිණුම්ගත කල යුතුය. එසේ ගිණුම් ගත කිරීමේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් ප්‍රදානයන් හා පරිත්‍යාග ආදායම් ගත කිරීම සිදුකල යුතු ය.

උදාහරණ වශයෙන් පරිත්‍යාග ලෙස පුද්ගලයෙකුගෙන් හෝ ආයතනයකින් රු.40,000.00ක් වටිනා මේසයක් සමිතියට ලැබුණුවිට,

<u>පරිත්‍යාගය ගිණුම්ගත කිරීම</u>

උපකරණ ගිණුම	(හර)	40,000.00	
පරිත්‍යාග ගිණුම			40,000.00

<u>ක්ෂය කරනු ලබන අවස්ථාවේදී</u>

උපකරණ ක්ෂය ගිණුම (හර)	8,000.00	
ක්ෂය වෙන් කිරීම්		8,000.00

<u>පරිත්‍යාගය ආදායම්ගත කිරීම</u>

පරිත්‍යාග ගිණුම්	(හර)	8,000.00	
පරිත්‍යාග ආදායම් (වෙනත් ආදායම් යටතේ)			8,000.00

උපකරණයේ ඵලදායී ජීව කාලය අවසානයේදී උපකරණ පරිත්‍යාග ගිණුමේ ශේෂය බිංදුවක් විය යුතුය.

පරිත්‍යාග ලෙස සමිති වලට ලැබෙන සියළුම වත්කම් සම්බන්ධයෙන් වෙනම උපකරණ ලේඛණයක් පවත්වාගෙන යා යුතුය.

ඉහත විශේෂයෙන් සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වලට අමතරව බැංකු නියාමන ජාතික ඒකකය මගින් හඳුන්වාදී ඇති විගණන ආකෘති අත්පොත් වල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අදාල කරගත යුතුය.

3.2 සමිතිය සතු තොග පවත්වාගෙන යෑම , නඩත්තු කිරීම , ගිණුම්ගත කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව, සමිතිය සතු තොග පවත්වාගෙන යෑම , නඩත්තු කිරීම , ගිණුම්ගත කිරීම සිදුකල යුතුය. තොග ගණන් ගැනීම සිදුකරන අවස්ථාවේදී ප්‍රමිතිය අනුගමනය කල යුතු අතර තොග වටිනාකම ගිණුම්ගත කිරීමේදී පහත පියවරයන් අනුගමනය කල යුතුය.

තොග ගණන් ගැනීමේදී හඳුනාගත් තොග වටිනාකමින්, එනම් පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් (ගැණුම් මිල හෝ විකුණුම් මිල) යන දෙකෙන් අඩු වටිනාකම විකුණුම් පිරිවැය ගණනය කිරීමට වෙළඳ ගිණුමට ගෙන යා යුතු අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් ලෙස වැඩි වටිනාකම පෙන්විය යුතුය. එම අගයන් දෙකේ වෙනස ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය හා වෙනත් වියදම් වල වියදමක් ලෙස පෙන්වීමට කටයුතු කල යුතුය.

3.3 උපචිත පදනම යටතේ ගිණුම් සටහන් පැනවීම.

සමුපකාර සමිති වල ගිණුම් තැබීම උපචිත පදනම මත සිදුකිරීම සුදුසු වන අතරම ආරක්ෂණ සංකල්පය පදනම් කරගෙන මෙම සටහන් පැනවිය යුතු බැවින් සාමාජිකයන් වෙත නිකුත් කරන ණය සඳහා ලැබිය යුතු පොළී ගිණුම්ගත කිරීමේදී උපචිත පදනම බැහැර කළ යුතුය. ණය සඳහා උපචිත පදනම මත පොළී සටහන් කිරීමේදී උපලබ්ධි නොවූ ආදායමක් පොත්වල නොපෙන්විය යුතු බවට වූ විචක්ෂණ සංකල්පයද සැලකිල්ලට ගනිමින් ණය සඳහා ලද පොළී පමණක් ගිණුම්ගත කිරීම සුදුසු බවට වැඩිදුරටත් උපදෙස් දෙමි.

3.4 කොටස් වෙළඳපොලේ ලයිස්තු ගත සමාගම්වල කොටස් ආයෝජන

කොටස් වෙළඳ පොලේ ලයිස්තුගත සමාගම්වල කොටස් මිලදී ගත් යම් සමිතියක් වේ නම් ඒ සමිති කොළඹ කොටස් වෙළඳපලේ මධ්‍යම තැන්පතු ඒකකයේ සමිතිය නමින් ගිණුමක් (CDS Account) ආරම්භකර පවත්වාගත යුතු අතර ඒ මගින් කොටසක වෙළඳපොල අගය හා ශේෂ සනාථනයන් ලබාගෙන ඉදිරිපත්කල යුතුය. කොටස් වෙළඳපොලේ ලයිස්තුගත සමාගම්වල කොටස් සම්බන්ධයෙන් පහත පරිදි ගිණුම් තැබීම කල යුතුය. ඒ අනුව මිල වෙනස්වීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ධන හෝ ඍණ අගයක් සේ සටහන් පැනවීම සිදුකල යුතුය.

උදාහරණය:-

සමිතිය විසින් 2023.01.01 දින මිලට ගත් කොටස් සංඛ්‍යාව 01 ක් වන අතර කොටසක මිලදීගත් අගය රුපියල් 100.00ක් වේ. එහි 2023.12.31 දිනට කොටස් වෙළඳපොල අගය රුපියල් 140.00 ක් වේ යැයිද 2024.12.31 දිනට කොටස් වෙළඳෙපොල අගය රුපියල් 90.00 ක් යැයිද උපකල්පනය කරමු.

<u>කොටස්වල වෙළඳපොල අගය ඉහල යාම</u>

කොටස් වෙළඳපොලේ ලයිස්තුගත සමාගම්වල කොටස් ගිණුම	(හර)	40.00	
මූල්‍ය වත්කම් වල සාධාරණ අගය මැනීමේ ලාභ ගිණුම			40.00

(විස්තීරණ ආදායම්වල ධණ අගයක් සේ දැක්විය යුතුය)

<u>කොටස්වල වෙළඳපල අගය පහල යාම</u>

මූල්‍ය වත්කම් වල සාධාරණ අගය මැනීමේ අලාභ ගිණුම	(හර)	50.00	
කොටස් වෙළඳපොලේ ලයිස්තුගත සමාගම්වල කොටස් ගිණුම			50.00

(විස්තීරණ ආදායම්වල ඍණ අගයක් සේ දැක්විය යුතුය)

ඒ අනුව:-

2023.12.31. ට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන අගය	රු	140.00
2024.12.31. ට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන අගය	රු	90.00

3.5. කොටස් ලාභාංශ ප්‍රසාද කොටස් වශයෙන් ලැබීමේදී,

දැනට සමිති විසින් ප්‍රසාද කොටස් ගිණුම්ගත කිරීම විවිධ ආකාරයෙන් කටයුතු කරන බැවින් පහත අයුරින් ගිණුම්ගත කිරීමට උපදෙස් දෙමි.

කොටස් වෙළඳපොලේ ලයිස්තුගත සමාගම්වල කොටස් ගිණුම (හර) XXXX
කොටස් ලාභාංශ ආදායම් ගිණුම XXXX

(ආයෝජන කොටස් සඳහා සාමාජිකයන්ගෙන් එකතුකර ආයෝජනය කර ඇති අවස්ථාවකදී එම ආයෝජන සඳහා ලැබෙන ප්‍රසාද කොටස් ලාභාංශ සාමාජිකයා දායක වූ ප්‍රමාණය අනුව සමානුපාතිකව ගිණුම්ගත කල යුතුය)

3.6. තිරක ප්‍රදාන ගිණුම් ගතකිරීම

තිරක ප්‍රදානයක් ගිණුම්ගත කිරීමේදී පහත ක්‍රියාවලිය අනුගමනය කිරීමට උපදෙස් දෙමි.

<u>තිරක ප්‍රදානයක් ලැබීම</u>

තිරක ප්‍රදාන ලත් ණය (හර) XXXX
(තිරක ප්‍රදානයේ සඳහන් මුදල)
    අදාල කල්පසු ණය XXXX
    උපලබ්ධි නොවූ ආදායම් වෙන්කිරීම් XXXX

(මෙම ගිණුමේ ශේෂය ඇතුලට ණය පොලිය හා තිරක ගාස්තු සහ ලිපිද්‍රව්‍ය හා වෙනත් යන අගයන් දෙකම ඇතුලත් විය යුතුය.)

<u>තිරක ප්‍රදානය දුන් පසු මුදල් ලැබීම සිදුවන්නේනම්:</u>

මුදල් (හර) XXXX
    තිරක ප්‍රදාන ලත් ණය
    (ලැබෙන මුළු මුදල)
උපලබ්ධි නොවූ ආදායම් වෙන්කිරීම් (හර) XXXX
    පොලී ආදායම XXXX
(උපලබ්දි නොවූ ආදායම් ලෙස ගිණුම් ගත කල ආදායම උපලබ්දි වීම)

<u>තිරක ප්‍රදාන උසාවිගත කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී</u>

උසාවිගත ණය ගැතියෝ (හර) XXXX
    තිරක ප්‍රදාන ලත් ණය XXXX
(තිරක ප්‍රදාන ලත් ණය උසාවිගත ණය ලෙස මාරු කිරීම)
සාමාජික විවිධ තැන්පත් ගිණුම් (හර) XXXX
    උසාවිගත ණය ගැතියෝ XXXX
(ණය උසාවි ගත කිරීමේදී ණය ගැතියාගේ තැන්පතු ශේෂ කපා හැරීම)

<u>උසාවියෙන් මුදල් අයවීම</u>

මුදල් (හර) XXXX
    උසාවිගත ණය XXXX
(ලැබෙන මුළු මුදල)
උපලබ්ධි නොවූ ආදායම් වෙන්කිරීම් (හර) XXXX
    පොලී ආදායම XXXX
    තිරක ගාස්තු XXXX
    ලිපිද්‍රව්‍ය හා වෙනත් ආදායම් XXXX
(උපලබ්දි නොවූ ආදායම් ලෙස ගිණුම් ගත කල ආදායම උපලබ්දි වීම)

(ණය ශේෂයට එරෙහිව කිසියම් සටහනක් යෙදීමේදී ඒ ණය ශේෂය නිර්මාණය වීමේදී ඇතිවූ උපලබ්ධි නොවූ ආදායම් වෙන්කිරීම් හර කිරීම සඳහා ඉහත පරිදි සටහන් යෙදිය යුතුය.)

3.7. බඩු අඩුව ගිණුම්ගත කිරීම (ගැණුම් මිලට)

බඩු අඩුවක් ගිණුම්ගත කිරීමේදී පහත ක්‍රියාවලිය අනුගමනය කිරීමට උපදෙස් දෙමි.

ලැබිය යුතු බඩු අඩු ගිණුම (කලමණාකාර ණය ගැති) (හර) XXXX
බඩු අඩුව ගිණුම XXXX
(වෙළඳ ගිණුමේ ගැණුම් වටිනාකමින් අඩුකර දැක්විය යුතුය)

ගැණුම් මිල හා විකුණුම් මිල අතර වෙනස හා සිදුවූ මූල්‍ය හානිය ගණනය කර තිරක ප්‍රදානයකදී ඉල්ලා සිටීමේ අයිතිය සමිතිය සතුය.

අලෙවි නොවන තොග ඉතිරි තොග ගණන් ගැනීමේදී ඉතිරි බඩු තොගයේ වටිනාකමට ඇතුලත් නොවිය යුතුය.

3.8. ජංගම නොවන වත්කම් බැහැර කිරීම

ජංගම නොවන වත්කම් බැහැර කිරීමේදී වත්කම් බැහැර කිරීමේ ගිණුම හරහා ඇතිවන ලාභාලාභ තත්ත්වයන් සංචිත ලෙස ගිණුම්ගත නොවිය යුතු අතර ප්‍රවර්තන වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ගැලපිය යුතුය.

3.9. ඉඩම් ගොඩනැගිලි ලේඛන

ඉඩම් හා ගොඩනැගිලි වල ගත් මිල වෙනම හඳුනාගත හැකිවන පරිදි ඉඩම් හා ගොඩනැගිලි ලේඛණය සහ ගිණුම සකස්කල යුතුය. වර්තමානය වන විට එකම ගිණුමක පෙන්වා ඇති අවස්ථා පවතින බැවින් ඉදිරියේදී එම තත්වය තවදුරටත් නොපැවතිය යුතු අතර එවැනි අවස්ථාවක සාධාරණ පදනමක් මත වටිනාකම් වෙන් කල යුතුය.

3.10 ව්‍යාපෘති

විවිධ සේවා සමූපකාර සමිති වල මූල්‍ය සේවා අංශය මගින් ව්‍යාපෘතියක් සිදුකරන්නේ නම් එය මූල්‍ය සේවා සපයන ව්‍යාපෘතියක්ම විය යුතුය. එසේ නොවන ව්‍යාපෘති වෙළඳ අංශය මගින් ක්‍රියාත්මක විය යුතුය.

එසේම, යම් සමූපකාර සමිතියක් ව්‍යාපෘතීන් සිදුකිරීමේදී ඒ ඒ ව්‍යාපෘති සඳහා වෙන වෙනම ගිණුම් ඉදිරිපත් කිරීම ගිණුම් ප්‍රමිත අනුව සිදුකිරීම සුදුසුය. නිර්දේශිත ආකෘතියට බාහිර වෙනත් ව්‍යාපාරික හා සේවා අංශ සඳහා ගිණුම් ආකෘතිය හා ගිණුම් සටහන් ඊට අනුරූපීව සමිතිය විසින් සකස්කර ගත යුතු අතර, ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ඇත.

3.11. විශේෂ අවධානය යොමු විය යුතු කරුණු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (LKAS 01) ට අනුව සමිතියේ වත්කම්, වගකීම් හා ආදායම්, වියදම් නිලවීකර ගිණුම්වල නොපෙන්විය යුතුය. එසේ වුවත් LKAS 18 (අයභාරය) හා LKAS 37(ප්‍රතිපාදනයන්, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්) යන ප්‍රමිත වලින් ලබාදී ඇති ප්‍රතිපාදන වලදී ඉඩදී ඇති නිලවූකිරීම් පමණක් සිදුකල හැකිය.

LKAS 18 (අයභාරය) අනුව ලැබෙන හා ලැබිය යුතු දැ වල සාධාරණ අගය ගණනය කල යුතු අතර, වෙළඳ වට්ටම් හා සහනාධාර අඩුකර පෙන්විය හැකිය. උදාහරණ ලෙස දේපල හා පිරියත විකුණුම් ගිණුම්ගත කිරීමේදී වත්කමේ ධාරණ අගය හා විකිණීම සඳහා ගිය වියදම්, වත්කම් ඉවත්කිරීමේ ගිණුමකින් පෙන්විය යුතුය.

LKAS 37 (ප්‍රතිපාදනයන්, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්) අනුව ප්‍රතිපාදනයට අදාල ශුද්ධ වියදම් මූල්‍ය ප්‍රකාශනයන් තුලින් හෙලිදරව් කිරීම කල යුතුය.

3.12. නිෂ්පාදන ගිණුම් ආකෘතිය සහ ඊට අදාල ගිණුම් සටහන්

නිෂ්පාදන ගිණුම් ආකෘතිය සහ ඊට අදාල ගිණුම් සටහන්ග්‍රාමීය බැංකු නියාමන ඒකකය විසින් හඳුන්වා දී ඇති ගිණුම් ආකෘති තුල නිෂ්පාදන අංශ සඳහා ගිණුම් ආකෘතියක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් පහත පරිදි නිෂ්පාදන ගිණුම් ආකෘතිය සහ ඊට අදාල ගිණුම් සටහන් හඳුන්වා දෙමි.

<u>නිෂ්පාදන අංශයේ විස්තීරණ ආදායම් ප්‍රකාශන ආකෘතිය</u>

සීමාසහිත/රහිත.............................. සමුපකාර සමිතිය

.... දිනෙන් අවසන් වර්ෂය සඳහා

නිෂ්පාදන අංශයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනය

වාවහාර මුදල් ඒකකය රුපියල්

විස්තරය	සටහන් අංකය	පූර්වර්ථන වර්ෂය	ඉකුත් වර්ෂය	විචලනය
ප්‍රාථමික පිරිවැය	1	XXX	XXX	XX
නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	2	XXX	XXX	XX
එකතුකලා:- ආරම්භක නොනිමි තොගය		XX	XX	XX
		XXX	XXX	XX
අඩුකලා:- අවසාන නොනිමි තොගය		(XX)	(XX)	XX
නිෂ්පාදන පිරිවැය		XXX	XXX	XX
එකතුකලා:- නිෂ්පාදන ලාභය		XX	XX	XX
නිෂ්පාදන භාණ්ඩ මාරුකළ වටිනාකම් වෙළඳ ගිණුමට ගෙනගියා		XXX	XXX	XX

.... සිට ..... දක්වා ගිණුම් සටහන් නිෂ්පාදන අංශයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේම කොටසක් බවත් සමිතියේ පොත්පත් අනුව නිවැරදි බවත් සහතික කරමු.

....	....	....	....	....
ගරු සභාපති/ ගරු උප සභාපති	ගරු අධ්‍යක්ෂ	ගරු අධ්‍යක්ෂ	සාමාන්‍යාධිකාරී	ගණකාධිකාරී

සීමාසහිත/රහිත..................... සමුපකාර සමිතිය

.... දිනෙන් අවසන් වර්ෂය සඳහා

නිශ්පාදන අංශයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

ව්‍යවහාර මුදල් ඒකකය රුපියල්

විස්තරය	සටහන් අංක	ප්‍රවර්ථන වසර	පෙර වසර
ප්‍රාථමික පිරිවැය	1		
ආරම්භක අමුද්‍රව්‍ය තොගය		XX	XX
එකතුකලා			
අමුද්‍රව්‍ය ගැණුම්		X	X
ගෙනඒමේ කුලී		X	X
තීරු බදු		X	X
ගුදම් ගාස්තු		X	X
වෙනත්		X	X
		XXX	XXX
අඩුකලා			
අවසාන අමුද්‍රව්‍ය තොගය		(XX)	(XX)
පාවිච්චිකල අමුද්‍රව්‍ය පිරිවැය		XXX	XXX
එකතුකලා			
නිශ්පාදන වටුප්		X	X
සෘජු වියදම්		X	X
විස්තීරණ ආදායම් ප්‍රකාශයට ගෙන ගියා		XXX	XXX
නිශ්පාදන පොදුකාර්ය පිරිවැය	2		
කම්හල් විදුලිය		XX	XX
කම්හල් කුලී		XX	XX
කම්හල් රක්ෂණ		XX	XX
යන්ත්‍ර අළුත්වැඩියා		XX	XX
කම්හල් වේතන		XX	XX
යන්ත්‍ර ක්ෂය		XX	XX
වෙනත්		XX	XX
විස්තීරණ ආදායම් ප්‍රකාශයට ගෙන ගියා		XXX	XXX

දකුණු පළාතේ ලියාපදිංචි සියලුම සමුපකාර සමිති සඳහා සම්මත ගිණුම් ආකෘතීන් වශයෙන් මෙම චක්‍රලේඛයෙන් ලබාදුන් උපදෙස් වලට අමතරව 2016 වසරේදී රේඛීය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ බැංකු නියාමන ඒකකය විසින් හඳුන්වාදී ඇති ගිණුම් ආකෘතීන් සුදුසු පරිදි යොදාගත යුතු ය.

4. සුභසාධක අංශ වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යාම හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

ලියාපදිංචි සමුපකාර සමිති තම සාමාජිකයන්ගේ සුභසාධනය වෙනුවෙන් විවිධ අරමුදල් ගොඩනැගීම සිදුකරමින් පවතී. ඉන් සුභසාධක අරමුදල ප්‍රධාන අරමුදලක් ලෙස හඳුනා ගැනේ. මෙම අරමුදල විවිධාකාරයෙන් ගොඩනගාගෙන ඇති අතර එම අරමුදල ගොඩනැගීම සඳහා සමුපකාර සමිති වල සුභසාධක අංශයක් පවත්වාගෙන යනු ලබයි. මෙම සුභසාධක අංශය සහ සුභසාධක අරමුදල සම්බන්ධයෙන් විවිධ අවස්ථාවලදී නොයෙකුත් ආකාරයේ ගැටළු පැනනැගී ඇත. එම අරමුදල නඩත්තු කිරීම හා ගිණුම් පැනවීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුනාගැනීම කාලෝචිත බැවින් මින් ඉදිරියට පහත සඳහන් ක්‍රියාමාර්ග ඔබ විසින් අනුගමන කල යුතු ය.

4.1 සුභසාධක අරමුදල් ගොඩනගා ගත හැකි ක්‍රම

I. සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ නීතිමය ප්‍රතිපාදනයන්ට යටත්ව වාර්ෂික ශුද්ධ ලාභ විසර්ජනයෙන් පසු ඉතිරි ලාභයෙන් 10% ක් හෝ ඊට අඩු ප්‍රමාණයක්. (ඒ අනුව දැනට අතුරු ව්‍යවස්ථා ප්‍රතිපාදන නොමැති නම් අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කරගත හැකිය)

II. සමිතියේ සාමාජිකයන්ගෙන්, සුභසාධක අරමුදල සඳහා යම් දායක මුදලක් ලබා ගැනීම.(මෙම අරමුදල සඳහා වන දායක මුදල හෝ ඒ සඳහා පොලී ගෙවීමක් සිදු නොකල යුතුය)

III. වෙනත් ආධාර හෝ පරිත්‍යාග ලබාගැනීම් මගින්

IV. සුභසාධක ව්‍යාපාරික අංශයේ අතිරික්තයෙන් (සුභසාධක අංශයේ වාර්ෂිකව පිළියල කරනු ලබන ආංශික ගිණුමේ ආදායම් වියදම් අතර වෙනස)

4.2 සුභසාධක අරමුදල භාවිතා කල හැකි අවස්ථා

I. සාමාජිකයන්ගේ සුභසාධක කටයුතු සඳහා

II. සාමාජිකයන්ගේ දූදරුවන්ගේ සුභසාධන කටයුතු සඳහා

III. සාමාජිකයන්ගේ දෙමව්පියන්ගේ සුභසාධක කටයුතු සඳහා

IV. සුභසාධක අංශය වෙනුවෙන් වත්කම් අත්පත්කර ගැනීම සඳහා (දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 28 වගන්තිය අනුව සුභසාධක අංශයේ දේපල අත්පත් කර ගැනීමේ කටයුතු කල යුතුය)

4.3 සුභසාධක ව්‍යාපාරික අංශ / සුභසාධක අරමුදල ගිණුම් තැබීම

4.3.1 <u>සුභසාධක ව්‍යාපාරික අංශය ගිණුම් තැබීම</u>

I. මෙම සුභසාධක ව්‍යාපාරික අංශය සඳහාද සමිතියේ මුදල් පොතෙහිම ගණුදෙනු සටහන් කිරීම හා වෙනම උපයෝගී ලෙජර් පවත්වාගත යුතුය.

II. මුදල් වර්ෂය අවසන් වන දිනෙන් සුභසාධක ව්‍යාපාරික අංශය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශයක් පිළියෙල කර අතිරික්තය හෝ ඌණතාවය හඳුනාගත යුතුය.

III. අතිරික්තයක් හඳුනාගත් අවස්ථාවක ඉන් 25% ක් සමිතියේ පොදු ව්‍යවස්ථාපිත සංචිතය සඳහා ද , 5% ක් සමුපකාර අරමුදල සඳහාද වෙන්කල යුතුය. එකී වෙන්කිරීම් වලින් පසු අතිරික්තය සුභසාධක අරමුදලට බැරකල යුතුය. මෙම ගිණුම් පැනවීම සමිතියේ පොදු මූල්‍ය ප්‍රකාශන වලට අයත් ස්කන්ධය වෙන්ස්වීමේ ප්‍රකාශය තුලින් ඉදිරිපත් කල යුතුය.

IV. ඌණතාවයක් හඳුනාගත් අවස්ථාවක රු. 50.00 ක් සමුපකාර අරමුදල සඳහා වෙන්කිරීමෙන් අනතුරුව සමස්ථ ඌණතාවය සුභසාධක අරමුදලින් අඩුවන සේ සමිතියේ පොදු මූල්‍ය ප්‍රකාශන වලට අයත් ස්කන්ධය වෙන්ස්වීමේ ප්‍රකාශය තුලින් ඉදිරිපත් කල යුතුය.

4.3.2 <u>සුභසාධක අරමුදල ගිණුම් තැබීම</u>

I. සුභසාධක අරමුදල සඳහා මුදල් ලැබීමේදී සමිතියේ පවත්වාගෙන යනු ලබන ලැබීම් මුදල් පොතම භාවිතා කල යුතු අතර ලදුපත් ආශ්‍රයෙන් ලැබීම් මුදල් පොතේ සටහන් තැබිය යුතුය.

II. සුභසාධක අරමුදලේ ප්‍රතිදානයන් ගෙවීමේදී සමිතියේ භාවිතාකරනු ලබන ගෙවීම් මුදල් පොතම භාවිතා කල යුතු අතර වවුචර් පතක් ඇසුරින් ගෙවීම් මුදල් පොතේ සටහන් කල යුතුය.

III. සුහසාධක අංශයට අරමුදල් සම්පාදනය කිරීම සඳහා හෝ සාමාජික සුහසාධනය වෙනුවෙන් වන ව්‍යාපෘති වෙනුවෙන් වැය දැරීමද සුහසාධක අංශයේ වියදමක් ලෙස ගිණුු ගත කළ යුතුය.

IV. ඉහත සුහසාධක අරමුදලට ලැබීම් සහ ගෙවීම් වෙනුවෙන් පොදු ලෙජරයේ සුහසාධක අරමුදල නමින් ගිණුමක් ආරම්භකර සටහන් පැනවිය යුතුය.

4.4. පොදු උපදෙස්

4.4.1 සුහසාධක අරමුදල හා/හෝ සුහසාධක ව්‍යාපාරික අංශයක් පවත්වාගෙන යන්නේ නම් ඉහත සඳහන් නීතිරීති වලට යටත්ව ඒ සඳහා විධිමත් කාරක නියෝග මාලාවක් සකස්කර සමිතියේ මහ සභාවකින් අනුමත කරවා ගත යුතුය.

4.4.2 කාරක නියෝග මාලාවේ සඳහන් පරිදි සුහසාධක අංශයෙන් ලබාදෙන ප්‍රතිලාභ අඛණ්ඩව පවත්වාගෙන යා හැකි පරිදි සුහසාධක අරමුදල ශක්තිමත්ව පවත්වාගෙන යෑම කාරක සභාවේ වගකීමක් වේ.

4.4.3 සුහසාධක ව්‍යාපාරික අංශයේ කටයුතු නිසි කළමනාකරණයකින් යුතුව පවත්වාගෙන යාමත් අක්‍රමිකතාවන්ගෙන් තොරව පවත්වාගෙන යාමත් කාරක සභාවේ වගකීමක් වන අතර සමිතියේ මූලික ව්‍යාපාරික කටයුතු සුහසාධක අංශයෙන් සිදුනොකල යුතුය. (උදාහරණ : - ණය දීම හා තැන්පත් රැස්කිරීම)

4.4.4 සුහසාධක ව්‍යාපාරික අංශයේ ගිණුම් පොත්පත් සමිතියේ වාර්ෂික විගණනය සඳහා ඉදිරිපත් කල යුතුය.

4.4.5 සමුපකාර සමිතියේ නම භාවිතා කරමින් හෝ වෙනත් ආකාරයකින් සමිතිය තුල සුහසාධක අංශ වෙනම පවත්වාගෙන යා නොහැක.

4.4.6 සමිතියේ සුහසාධක අරමුදල් ශේෂය භාවිතා කරමින් සමිතියෙන් බැහැරව ඉතිරිකිරීම් / ස්ථාවර තැන්පත් ගිණුම් පවත්වාගෙන යා හැකි නමුත්,සමිතියේම සාමාජික නොවන ගිණුමක් ලෙස පවත්වාගෙන යාම සිදු කල නොහැක.ඒ අනුව සමිතියේ මුදලින් සුහසාධක අරමුදලේ ශේෂයට පොලියක්ද අරමුදල වෙත බැර කල නොහැක. ඒ ආයෝජනය වෙනුවන් ලබන ආයෝජන පොළී ආදායම සුහසාධක අංශය සඳහා වන විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ආයෝජන ආදායම් ලෙස ගිණුම්ගත කල යුතුය.

4.4.7 සුහසාධක අරමුදලේ ශේෂය මූල්‍ය තත්ව ප්‍රකාශයේ සංචිත හා අරමුදල් යටතේ නිරූපනය කළ යුතු අතර එකී ශේෂයට පොළී ගණනය කිරීමක් සිදු නොකළ යුතුය.

4.4.8 මේ වන විටත් සුහසාධක අංශය වෙනුවෙන් සමිතිය තුල බාහිර තැන්පත් ගිණුම් පවත්වාගෙන යන්නේ නම් එම තැන්පත් ගිණුම් වල ඇති ශේෂයන් සුහසාධක අරමුදලට බැර කිරීමට කටයුතු කල යුතුය.

4.4.9 සුහසාධක අංශය සමිතියේ අංශයක් වන හෙයින් වාර්ෂික විගණනයේදී සුහසාධක අංශයේ ස්ථාවර වත්කම්ද සනාථන ලේඛණ සමගින් විගණනයට ඉදිරිපත් කල යුතුය.

5. සමුපකාර සමිතියක විගණනය සඳහා ගිණුම් ඉදිරිපත් කිරීම හා විගණනය සඳහා පහසුකම් සැපයීම.

5.1. දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 38 වගන්තිය හා 2019 සමුපකාර රීති මාලාවේ 38 වන රීතිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී තුන් මසක් ඇතුලත අදාල දිස්ත්‍රික්කයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වරයා වෙත ඉදිරිපත් කිරීම කළයුතුය. ඒ අනුව

I. මූල්‍ය තත්ව ප්‍රකාශනය (ශේෂ පත්‍රය)
II. විස්තීරණ ආදායම් ප්‍රකාශනය
III. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
IV. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
V. ආංශික විස්තීරණ ආදායම් ප්‍රකාශනයන්
VI. ගිණුම් ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්

VII. විස්තරාත්මක ශේෂ පිරික්සුම

VIII. ශේෂ සනාථන ලේඛණ (උපලේඛණ වල නම සා.අංකය ඇතුලත් කිරීම)

5.2. නිවැරදිව පිළියෙල කළ බවට හා පරීක්ෂා කල බවට තහවුරුවක් ලබාගැනීමෙන් අනතුරුව කාරක සභාව / අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරන ලද සම්පූර්ණ ගිණුම් කට්ටලයක් සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිළධාරී මගින් දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වරයා වෙත ඉදිරිපත් කිරීම කාරකසභාවේ / අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. (විගණන වාර්තාවේ අවසාන ගිණුම්, මූල්‍ය තත්ව ප්‍රකාශනය හා ඇමුණුම් සියල්ල සමිතියේ ගිණුම් වන්නේය. එසේ හෙයින් සමිතියේ සියළු මූල්‍ය ප්‍රකාශනවල සභාපති/උප සභාපති, අධ්‍යක්ෂකවරු/කාරකසභිකයන් දෙදෙනෙකුගේ අත්සන් සහිතව සහතික කොට දිනය යොදා ප්‍රඥප්තියේ 38(2) අනුව සහතික කිරීම අනිවාර්යය වේ)

5.3. විගණන නිළධාරීන් විසින් විගණයන සිදුකරගෙන යන අතරතුර සමිතියේ සියළුම නිළධාරීන්ගේ සහයෝගය හා අවශ්‍ය ලේඛණ ලබාදීම් සඳහා කළමණාකරනය විසින් තම කාර්‍ය මණ්ඩලය මෙහෙයවීම සිදුකල යුතුය.

5.4 එලෙස ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ කිරීම විගණක වරයාගේ වගකීම වේ. විගණක විසින් විගණනය සිදුකරන අතරතුර සමිතිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් හා විගණන පරීක්ෂා කිරීම් වලින් අනාවරණය වන කරුණු සම්බන්ධයෙන් විගණන කළමණාකරන ලිපි /විගණන විමසුම් මගින් විගණක විසින් සමිතියේ කලමනාකරණය වෙතින් සිදුකරනු ලබන විමසීම් වලට සමිතිය විසින් දක්වනු ලබන ලිඛිත ප්‍රතිචාරයන්ද විගණකගේ වාර්තාව පිළියෙල කිරීම සඳහා පදනම් කර ගනු ලැබේ.

5.6 විගණනය අතරතුර ඉහත අයුරින් සිදු කරණු ලබන විමසීම් අනුව, මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් විගණනය සිදුකරනු ලබන කාලසීමාව තුලදී සමිතියේ කලමනාකරණය වෙත පවතී.

5.7 පෙර වසරවලට අදාලව ලාභයට බලපානු ලබන ගැලපීම් පවතී නම් අධ්‍යක්ෂ මණ්ඩල/කාරක සභා තීරණයක් මත ප්‍රවර්තන වර්ෂයේදී ලාභයට ගැලපීම් සිදුකල හැකි ය.

6. මවිසින් 2016.11.10 දිනැතිව නිකුත්කර ඇති නීති 2016/02 හා 2017.11.23 දිනැතිව නිකුත්කරන ලද දප/සමු/විගණන/2017/01 සිට 05 දක්වා චක්‍රලේඛ මින් අවලංගු කරමි.

7. මෙම චක්‍රලේඛයේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම පිණිස මවිසින් දකුණු පළාතේ සමුපකාර සමිතිවල සංවර්ධන කටයුතු, විගණන කටයුතු භාරව කටයුතු කරන සමුපකාර සංවර්ධන නිලධාරින් දැනුවත් කර ඇත.

සී.වික්‍රමසිංහ,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත .

සී. වික්‍රමසිංහ
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප.)
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

පිටපත් -
1. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ගාල්ල/මාතර/හම්බන්තොට) - අ.ක.ස
2. සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන් වෙත - අ.ක.ස.